# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1920/22 - 2015 ජූනි මස 24 වැනි බදාදා - 2015.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම,

(අ) 1958 අංක 4 දරන, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත මගින්, පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සතු කර ඇත්තා වූ ද, මෙම නියමයේ පළමු වන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති හැගල්ල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1994 අප්‍රේල් මස 21 වැනි දින අංක 815/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ඉහත කී පනතේ 27 අ වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ සාදන ලද හැගල්ල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩමේ කොටසක් වන්නා වූ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම්වල බිම් ප්‍රමාණයට අදළ වන්නාවූ නියමවල කොටස් එකී සංස්ථාව වෙත සතු කිරීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදළ යම් යම් නියමයන් හෝ කොන්දේසියක් අනුව ක්‍රියා කර නොමැති වීම හේතුවෙන් එකී නියමයන් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින් එම නියමයන් මෙයින් සංශෝධනය කරමි.

(ආ) එම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමෙන් පසුව එකී ඉඩම්වල බිම් ප්‍රමාණයන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත සතුකර දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 ජූනි මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.


1A - G 21756 — 16 (2015/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමු වන උපලේඛනය

හැගල්ල වත්ත යනුවෙන් සඳහන් කරනු ලබන ඉඩමෙන් පවරාදුන් සම්පූර්ණ ප්‍රමාණය

| *ගැසට් නිවේදන පිළිබඳ විස්තර* | *ඉඩමේ නම* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් වලින්* |
|---|---|---|---|---|
| 1994.04.21 දින අංක 815/10 | හැගල්ල වත්ත | කළුතර | හොරණ මිල්ලනිය | 106 |

## දෙවන උපලේඛනය

කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටස්

| *වෙන්කර දී ඇති විශේෂ අංකය* | *ඉඩමේ නම* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | *කොමිෂන් සභාව වෙත නැවත සතුකර දෙන ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| ක/15 | හැගල්ල වත්ත | කළුතර | හොරණ මිල්ලනිය | වැවල, මාහේන තිබ්බොටුගොඩ | පී. ඩී. ගුණසේකර මානක තැනගේ අංක 2672 හා 2011 අගෝස්තු සිට 2012 ජූලි මැණ සකස් කරන ලද පිඹුරේ කැබලි අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, හා 9 දරන හෙක්ටයාර් 58.0171 (අක්කර 143 රූඩ් 1 පර්චස් 18.09) න් යුක්ත වූ ඉඩම් කොටස |

07 - 426

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.